# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2030/8 - 2017 ජූලි මස 31 වැනි සඳුදා - 2017.07.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KOT/LND/ACQVI/01/12.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 03J/83/E/348.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පැලවත්ත ග්‍රාම නිලධාරි වසමේ පැලවත්ත ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 4 සහ 40 හි, පත්‍ර අංක 29 හි අතිරේක අංක 25 හි කැබලි අංක 695 ක් වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4300 ක් වූ ඕකන්දෙහේනවත්ත නැමැති ඉඩම් කැබැල්ලට මායිම්:

**කැබලි අංක 695 — ඉඩමේ නම: ඕකන්දෙහේනවත්ත — මුල් හිමිකම් කියන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව — ප්‍රමාණය : හෙක්ටයාර් 0.4300**

*උතුරට*: කැබලි අංක 48B, 48C, 526, 597 සහ 527; *නැගෙනහිරට*: කැබලි අංක 48C, 526, 697, 527, 169, 170, 59, 137 සහ 64 Q: *දකුණට*: කැබලි අංක 169, 170, 59, 137, 64Q සහ 64P: *බස්නාහිරට*: කැබලි අංක 546, 545, 542, 529, 528. 530. 696, 531, 532, 533, 534 සහ 48B

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් ඇති සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 සැප්තැම්බර් මස 25 වැනි දින පෙ. ව. 10.00 කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 සැප්තැම්බර් මස 18 වැනි දිනට මත්තෙන් ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිලිවලින් දැනුම් දිය යුතු ය.

ගනේෂ අමරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කොටපොල.

2017 ජූලි මස 27 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

08 - 506

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: KDS/UDP/4/1/LAQ/NM/2.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 13/99VEP/414.

**අටබාගේ නෝනමලය වත්ත ඉඩම් කොටසක් ගම් පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම**

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාවය ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර*:

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳුකර ඉහළ කෝරළේ, ගලත ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මැණුම්පති විසින් මැන පිළියෙල කරන ලද අංක 5844 දරන පිඹුරේ කැබැලි අංක 1 හා 2 දක්වා ප්‍රමාණයෙන් හෙක්ටයාර් 21.6678 ක් වන අටබාගේ වත්ත නම් ඉඩම් කොටස. (කැබලි විස්තර ලැයිස්තුව අමුණා ඇත):

**01. කැබලි අංකය 01**

ඉඩමේ නම: අටබාගේ වත්ත: පිඹුරු අංකය: 5844: හිමිකම් කියන අයගේ විස්තර: ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව: අත්පත් කරගත් ප්‍රමාණය: හෙක්ටයාර් 16.7058

**02. කැබලි අංකය 02**

ඉඩමේ නම: අටබාගේවත්ත: පිඹුරු අංකය: 5844: හිමිකම් කියන අයගේ විස්තර: ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව: අත්පත් කරගත් ප්‍රමාණය: හෙක්ටයාර් 4.9620

වන්දි පරීක්ෂණ දිනයන් හා වේලාව:

| *අනු. අංකය* | *පිඹුරු අංකය* | *කැබැලි අංකය* | *වන්දි පරීක්ෂණ දිනය* | *වේලාව* | *ස්ථානය* |
|---|---|---|---|---|---|
| 01 | මු.පි.මහ 5844 | 01 හා 02 | 2017.08.23 | ප.ව.1.30 | ගම්පොල උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 අගෝස්තු මස 23 වැනි දින ප. ව. 1.30ට උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2017 අගෝස්තු මස 16 වැනි දිනට මත්තෙන් එම ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ආර්. ඒ. ඩී. ටී. එන්. තෙන්නකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
උඩපළාත කොට්ඨාසය,
ගම්පොල.

2017 ජූලි මස 25 වැනි දින,
ගම්පොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 507

---

### ශුද්ධි පත්‍රිකාව

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : BD/ST/LND/I/ACQUI/1/7/93.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/8/2014/pc/26.

ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වන පරිච්ඡේදය) 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ 2017.07.04 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* අංක 2026/24 හි මා විසින් පළ කළ දැන්වීමේ කුරිඇල්ලේගම ගමෙහි යන්න උඩලඇල්ලේගම ගමෙහි ලෙසට සංශෝධනය විය යුතු වේ.

එච්. එම්. නන්දසේන,
ප්‍රාදේශීය ලේකම්,
සොරණාතොට.

2017 ජූලි මස 26 වැනි දින,
සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 508

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.